ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන උපාධි පාඨමාලාව-සිව්වන මට්ටම/අන්තර් මාධ්‍ය මට්ටම
MCU 2207 – සාර්ව ආර්ථික විද්‍යාව
අඛණ්ඩ ඇගයීම් – මැයි 2006

කාලය : පැය දෙකයි

දිනය : 2006 මැයි 06 වේලාව : ප. ව. 2.00 – 4.00

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06

උපදෙස් : තෝරාගත් ප්‍රශ්න හතර (04) කට පමණක් පිළිතුරු සපයන්න. සියළුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු වෙන් කර ඇත. අත් අකුරු පැහැදිලි විය යුතුය.

1 i රටක මූලික සාර්ව ආර්ථික විද්‍යා අරමුණු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii "පාරිභෝජන ශ්‍රිතය" යනු කුමක්ද? (ලකුණු 05)

iii සිව් අංශ ආර්ථිකයකට (Four sector economy) අදාළ පහත විස්තර දී ඇත.

$C = 80 + 0.8\ Yd$ (පාරිභෝජන)
$T = 10 + 0.1\ Y$ (බදු)
$I = 100$ (ආයෝජන)
$G = 128$ (රජයේ වියදම්)
$M = 20 + 0.2Y$ (ආනයන)
$X = 80$ (අපනයන)

( සංඛ්‍යා රුපියල් බිලියන වලින්)

(අ) ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 06)

(ආ) වියදම් ගුණකය (Expenditure Multiplier) සොයන්න. (ලකුණු 04)

(ඇ) ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් රජයේ වියදම් රුපියල් බිලියන 12 කින් වෙනස් කළේ යැයි සිතන්න. නව ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 05)

2 (i) IS වක්‍රය සෘණ බෑවුමකින් යුක්ත වීමටත් , LM වක්‍රය ධන බෑවුමකින් යුක්ත වීමටත් හේතු පැහැදිලි කරන්න (ලකුණු 04)

(ii) අර්ධ තෙරපුම් ප්‍රතිවිපාකය ( Partial Crowding out effect ) යනු කුමක්ද? (ලකුණු 06)

(iii) ද්‍රවශීලතා උගුල යනු කුමක්ද? එවැනි අවස්ථාවකදී වඩාත් ඵලදායි ප්‍රතිපත්තිය කුමක්දැයි පහදන්න ? (ලකුණු 15)

3 පහත මාතෘකා යටතේ කෙටි සටහන් ලියන්න.

(i) උච්චතාවල ද්විත්ව සම්පාතය
(ii) මුදලෙහි සමපේක්ෂණ ඉල්ලුම
(iii) ආරෝපනය (Imputation)
(iv) පටු සහ පුළුල් මුදල් සැපයුම
(v) දෙවරක් ගිණීම (Double Counting) (ලකුණු 05x05)

4 (i) ආදායම් ප්‍රවේගය යනු කුමක්ද? (ලකුණු 05)

(ii) සම්භාව්‍ය කේනිසියානුවන් (Clasicl Keynisians) සහ මූල්‍යවාදීන් (Monitorists) ආදායම් ප්‍රවේගය පිලිබඳ සමාන මත දරුවේද? (ලකුණු 05)

(iii) "සම්භාව්‍ය ආර්ථික විද්‍යාවට අනුව මුදල් සැපයුම සහ මිල අතර සෘජු සම්බන්ධතාවයක් ඇත". ඔබ එකඟ වන්නේදැයි පහදන්න. (ලකුණු 15)

5 (i) ආර්ථික වෘද්ධිය යනු කුමක්ද? (ලකුණු 05)

(ii) එක්තරා ආර්ථිකයක පූර්ණ සේවා නියුක්තිය යටතේ නිමැවුම් මට්ටම රුපියල් බිලියන 800 ක් වන අතර සත්‍ය නිමැවුම් මට්ටම රුපියල් බිලියන 700 ක් වන බව සිතන්න. මූල්‍ය ප්‍රතිපත්තීන් උපයෝගී කර ගනිමින් පූර්ණ සේවා නියුක්ති තත්වයක් ඇති කරගත හැක්කේ කෙසේදැයි පහදන්න.
(ඉතිරි කිරීම් සඳහා ආන්තික නැඹියාව 0.2 ලෙස සලකන්න) (ලකුණු 10)

(iii) එවැනි ප්‍රතිපත්තියක වාසි අවාසි මොනවාද? (ලකුණු 10)

6. (i) නාමික දළ ජාතික නිෂ්පාදිතය සහ මූර්ත දළ ජාතික නිෂ්පාදිතය අතර වෙනස පහදන්න (ලකුණු 05)

(ii) සංවර්ධනය වෙමින් පවතින රටක ජාතික ආදායම ඇස්තමේන්තු කිරීමේ ඇති අවුලුහුවුනා තවරේද? ශ්‍රී ලංකාව විශේෂයෙන් සැලකිල්ලට ගන්න. (ලකුණු 20)

- සිම්කම් ඇව්රිණි -